
# විද්‍යාව 7 ශ්‍රේණිය - හතරවන සතිය

**ක්‍රියාකාරකම 02** : වස්තුවක් මගින් ඡායාවක් ලබා ගැනීම

- ක්‍රමය : විනිවිද පෙනෙන වීදුරු කැබැල්ලක් (A), රබර් බෝලයක් (B), කළු කඩදාසියක් (C), පෑනක් (D) , මල් වීදුරු කැබැල්ලක් (E), ඉටි පන්දමක් , තිරය සඳහා සුදු කඩදාසියක් ගෙන පහත රූපයේ පරිදි තබමින් සෙවනැල්ලක් ලබා ගත හැක්කේ කුමන ද්‍රව්‍ය තුලින්දැයි නිරීක්ෂණය කරන්න.



- නිරීක්ෂණය :

පැහැදිලි සෙවනැල්ලක් ලබා ගත හැකි ද්‍රව්‍ය : ..............................................
..............................................
..............................................

පැහැදිලි සෙවනැල්ලක් ලබා ගත නොහැකි ද්‍රව්‍ය : ..............................................
..............................................
..............................................

- ප්‍රශ්නය : 1. ඉහත සමහර ද්‍රව්‍ය තුලින පමණක් පැහැදිලි සෙවනැල්ලක් ලැබීමට හේතුව කුමක්ද?

.....................................................................................................................................
.....................................................................................................................

**සටහන : මෙම පාඩමේ පැහැදිලි සෙවනැල්ල ඡායාව ලෙස හැඳින්වේ.**

**ක්‍රියාකාරකම 03** : අතීතයේ දී කාලය මැනීම සිදුකළ ආකාරය අපිත් කරමු.

- ක්‍රමය : මීටර 1ක පමණ දිග ලී පතුරක් මිදුලේ හොඳින් හිරු එළිය වැටෙන ස්ථානයක සවි කරන්න. උදෑසන 9.00 සිට සවස 5.00 දක්වා පැයකට වරක් ලී කැබැල්ලේ සෙවනැල්ලේ දිග හා දිශාව සටහන් කරගන්න.




- නිරීක්ෂණ :

| වේලාව | ඡායාවේ දිග | ඡායාවේ දිශාව |
|---|---|---|
| පෙ:ව: 9.00 | | |
| පෙ:ව: 10.00 | | |
| පෙ:ව: 11.00 | | |
| මධ්‍යහ්න 12.00 | | |
| ප:ව: 1.00 | | |
| ප:ව: 2.00 | | |
| ප:ව: 3.00 | | |
| ප:ව: 4.00 | | |
| ප:ව: 5.00 | | |

- ප්‍රශ්නය :
  1. උදෑසන 9.00-12.00 දක්වා හා දහවල් 1.00-5.00 දක්වා ලී පතුරේ ඡායාවේ දිග හා දිශාව වෙනස් වීම සිදු වූයේ කෙසේද?

  .....................................................................................................................................
  .....................................................................................................................................

  2. ඉහත ක්‍රමය යොදාගෙන ඔරලෝසුවක් නොමැතිව වුවත් දවසේ කාලය පිළිබඳව ඔබට කිව හැකිද? ........................................

ඩී. මහේෂා අබේවර්ධන - ර/බල. සාන්ත ඇග්නස් බාලිකා ම.වි.